ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතාගේ සංචාරය ශ්‍රී ලංකාවේ ජනතාවට සෞභාග්‍යය සහතික කරයි

ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතා 2023 ජනවාරි 19-20 දිනවල ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත විය. විදේශ කටයුතු අමාත්‍යවරයා ලෙස සිය සිව්වන ශ්‍රී ලංකා සංචාරයෙහි නිරත වූ ජයිශංකර් මහතා සමඟ නව දිල්ලි විදේශ කටයුතු අමාත්‍යාංශයේ සිව් සාමාජික නියෝජිත පිරිසක් ද දිවයිනට පැමිණියහ. විදේශ කටයුතු අමාත්‍යතුමා 2019 නොවැම්බර්, 2021 ජනවාරි සහ 2022 මාර්තු යන මාසවලදී ද ශ්‍රී ලංකාවේ සංචාරය කළේය.

2. සිය සංචාරය අතරතුර දී විදේශ කටයුතු අමාත්‍යතුමා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහ අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා හමු වූ අතර විදේශ අමාත්‍ය එම්. යූ. එම්. අලි සබ්‍රි මහතා සමඟ දීර්ඝ සාකච්ඡාවන් හි නිරත විය. ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් පවත්වන ලද නියෝජිත මට්ටමේ හමුව සඳහා වරාය, නාවික කටයුතු සහ ගුවන් සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා, සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල, කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය දිලුම් අමුණුගම, විදුලිබල සහ බලශක්ති අමාත්‍ය කංචන විජේසේකර සහ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය යන අමාත්‍යවරුන් ද සහභාගී වූ අතර එම සාකච්ඡාව ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර විවිධ ක්ෂේත්‍රයන් හි වර්ධනය වන සහයෝගීතාවයෙහි පරාසය සහ ගැඹුර පිළිඹිබු කළේය.

3. ශ්‍රී ලංකා රාජ්‍ය නායකත්වය සමඟ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සාකච්ඡා දෙරට අතර පවතින ද්විපාර්ශවික සබඳතා හි සමස්ත වපසරිය සමාලෝචනය කිරීමට අවස්ථාවක් ලබා දුන්නේය. ශ්‍රී ලංකාව විවිධ අභියෝගයන්ට මුහුණ දෙන අවස්ථාවක සිදු කරන තම සංචාරය ඉන්දීය රජය සහ ජනතාව අඛණ්ඩව ශ්‍රී ලංකා ජනතාවට සහයෝගය ලබා දෙන බවට පැහැදිලි සහ ශක්තිමත් පණිවිඩයක් වන බව එතුමා අවධාරණය කළේය.

4. ඉන්දියාව විසින් පසුගිය වසරේදී පෙර නොවූ විරූ අයුරින් ලබා දුන් ඇමරිකානු ඩොලර් බිලියන 4ක මූල්‍ය සහයෝගය ඉන්දියාවේ "අසල්වැසියා ප්‍රථමයෙන්" යන ප්‍රතිපත්තිය හා සමපාත වන බව විදේශ කටයුතු අමාත්‍යතුමා සඳහන් කළේය. ණය ප්‍රතිව්‍යුහකරණය සඳහා සහය දුන් සහ ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගැනීම සඳහා මූල්‍ය සහතිකය ප්‍රකාශ කළ ප්‍රථම රට ඉන්දියාව බව එතුමා පෙන්වා දුන්නේය. ඉන්දියාව ශ්‍රී ලංකා ආර්ථිකයේ විවිධ ප්‍රධාන ක්ෂේත්‍රයන්හි අයෝජන දිරිමත් කරන බව එතුමා පැවසීය. ඉන්දියාව ශ්‍රී ලංකාවට අවශ්‍ය මොහොතේදී විශේෂයෙන් කැප වී කටයුතු කිරීමට සූදානම් බව එතුමා අවධාරණය කළේය. ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිත

අභියෝග ජයගැනීම සඳහා පුනර්ජනනීය බලශක්ති රාමුවක් මත පිහිටවූ ප්‍රතිපත්තිමය එකඟතාවය එතුමා විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

5. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා 2017 මැයි මාසයේදී අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් සිදු කළ ශ්‍රී ලංකා සංචාරය අතරතුර දී මුල්ගල තබන ලද පල්ලෙකැලේ උඩරට නර්තන ඇකඩමිය සඳහා ගොඩනැගිල්ලක් අතථ්‍ය ආකාරයෙන් විවෘත කළහ. ඉන්දීය ප්‍රදාන යටතේ ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල ශ්‍රී ලංකාවේ පොහොසත් සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ඉන්දියානු රජයේ කැපවීම පිළිඹිබු කරයි. ඉන්දියානු රජයේ ප්‍රදාන යටතේ ගාල්ල, මහනුවර, නුවර එළිය, අනුරාධපුර සහ බදුල්ල දිස්ත්‍රික්කයන් හි ඉදිකරන ලද නිවාස 350ක් ද අතථ්‍ය ආකාරයෙන් ජනතා අයිතියට පත් කරන ලදී. මෙම ව්‍යාපෘතීන් හි උපරිම සීමා දෙගුණ කිරීම සඳහා මෙන්ම ඉන්දියාව විසින් ක්‍රියාත්මක ඉහළ බලපෑමක් සහිත ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති රාමුව යටතේ ප්‍රදාන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම උදෙසා සමස්ත මූල්‍ය ප්‍රාග්ධනය ඉහළ නැංවීම තහවුරු කිරීම සඳහා ලියකියවිලි ද ඉන්දියානු සහ ශ්‍රී ලංකා රජයන් විසින් මෙහිදී හුවමාරු කර ගන්නා ලදී. සංවර්ධන සහයෝගීතාවයේ පුළුල් සහ ජනතා කේන්ද්‍රීය ස්වභාවය පිළිඹිබු කරමින් පොදු ප්‍රවාහනය ශක්තිමත් කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් දැනට ක්‍රියාත්මක ණය පහසුකමක් යටතේ බස් රථ 500ක් සැපයීමේ වැඩසටහනට අදාළ බස් රථ 50ක් සංකේතාත්මකව ප්‍රවාහන සහ මහා මාර්ග අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා හට භාර දෙන ලදී. විවිධ ක්ෂේත්‍ර තුළ ශ්‍රී ලංකාවට ලබා දෙන සහයෝගය ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථායිතාවය සහ ප්‍රතිසාධනය වෙනුවෙන් විවිධ ධාරිතා සංවර්ධන ව්‍යාපෘතීන් සහ වෙනත් වැඩසටහන් හරහා ශ්‍රී ලංකාවේ ජනතාව සමඟ රැඳී සිටීමට ඉන්දියානු රජයේ නොසැලෙන කැපවීම සංකේතවත් කරයි.

6. විදේශ කටයුතු අමාත්‍යතුමා යාපනය - චෙන්නායි ගුවන්ගමන් යළි ඇරඹීම සඳහා ගන්නා ලද පියවර අගය කළ අතර ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ප්‍රවාහන බෝට්ටු සේවා හැකි ඉක්මනින් අරඹනු ඇතැයි අපේක්ෂා කරන බව සඳහන් කළේය. ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයන් පිරිසක් පැමිණෙන රට ඉන්දියාව බව පෙන්වා දුන් එතුමා දෙරට අතර ආගමික සංචාර ප්‍රවර්ධනය කළ හැකි විවිධ ක්‍රියාමාර්ග ද සාකච්ඡා කළේය. දෙරට අතර කර්මාන්ත සහ සංචාරක කටයුතු ප්‍රවර්ධනය උදෙසා ගෙන ඇති පියවර දෙරට ජනතාව අතර අන්තර්ක්‍රියා ඉහළ නැංවීමට මෙන්ම පොදු සෞභාග්‍යය ළඟා කරගැනීමට ඉවහල් වන බව එතුමා සඳහන් කළේය.

7. මෙම වසරේදී කපිලවස්තු සර්වඥ ධාතූන් වහන්සේලා ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය කිරීම සඳහා ලබා දෙන ලෙසට ශ්‍රී ලංකා ජ්‍යෙෂ්ඨ නායකත්වය විසින් කළ ඉල්ලීම ඉන්දියාව ධනාත්මකව සලකා බලන ලෙස විදේශ කටයුතු අමාත්‍යතුමා දැනුම් දුන්නේය. රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිහිටුවීමේ 75 වන සංවත්සරය මෙන්ම ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ නිදහසේ 75 වන වසර නිමිත්තෙන් සමරු තැපැල් මුද්දර සහ කාසි නිකුත් කිරීම වැනි දෙරට විසින් ගන්නා ලද විවිධ ඒකාබද්ධ පියවර ද එතුමා සිහිපත් කළේය.

8. ආචාර්ය එස්. ජයිශංකර් මහතා හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ද හමු විය. එසේම, එතුමා ITAK, TELO, PLOTE, EPRLF, TNP, TNPF, SLMC සහ ACMC වැනි විවිධ දේශපාලන පක්ෂ නායකයන් ද හමු විය.

9. ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් අමාත්‍ය ජීවන් තොණ්ඩමාන් මහතාගේ නායකත්වයෙන් යුත් ලංකා කම්කරු කොංග්‍රසයේ නායකයෝ සහ ද්‍රවිඩ ප්‍රගතිශීලී සන්ධානයේ නායකයෝ වතුකර ප්‍රදේශවල ජනතාව විසින් මුහුණ දෙන සමාජ ආර්ථික දුෂ්කරතා අවධාරණය කළ අතර එම ගැටලු විසඳීම සඳහා ඉන්දීය සහය අපේක්ෂා කරන බව ප්‍රකාශ කළහ. එම ප්‍රදේශ නඟා සිටුවීම සඳහා ඉන්දීය රජය විසින් ගෙන ඇති විවිධ පියවර සිහිපත් කළ විදේශ කටයුතු අමාත්‍යතුමා 2023 වසරේදී ඉන්දියානු සම්භවයක් සහිත දමිළ ජනතාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් සම්පූර්ණ වන බව ප්‍රකාශ කළේය. මෙම ප්‍රජාව සමඟ සමීපව කටයුතු කරන මහනුවර සහකාර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය පිහිටුවා මෙම වසරට වසර 100ක් සම්පූර්ණ වේ.

10. විදේශ කටයුතු අමාත්‍යතුමා ජනාධිපතිතුමා සහ ධීවර අමාත්‍යතුමා සමඟ වෙන වෙනම දෙරට අතර ධීවර සහ ඒ ආශ්‍රිත මාතෘකා පිළිබඳව සාකච්ඡා පැවැත්වීය. මෙම අභියෝග සඳහා මානුෂීය ප්‍රවේශයකින් විසඳුම් සෙවීමේ අවශ්‍යතාවය එතුමා විසින් අවධාරණය කරන ලදී. එවැනි ධීවර කටයුතුවල නිරත වීමට ධීවරයන් පොළඹවන ජීවනෝපාය ගැටලු පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කරන ලදී.

11. විදේශ කටයුතු අමාත්‍යතුමා ශ්‍රී ලංකා ජනාධිපතිතුමා වෙත අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ සුභාශිංසන පිරිනැමූ අතර දෙපාර්ශවයටම පහසු දිනයක ඉක්මනින් ඉන්දියානු සංචාරයක නිරත වන ලෙස මෝදි අග්‍රාමාත්‍යතුමා කළ ආරාධනාව ජනාධිපතිතුමා වෙත පිළිගැන්වීය.

12. විදේශ කටයුතු අමාත්‍යතුමාගේ සංචාරය සමීපතම සමුද්‍රීය අසල්වැසියා වශයෙන් ඉන්දියාවේ “අසල්වැසියා ප්‍රථමයෙන්” යන ප්‍රතිපත්තිය තුළ ශ්‍රී ලංකාවට හිමි වන කේන්ද්‍රීය ස්ථානය පිළිඹිබු කරයි. ආර්ථික ප්‍රතිසාධනය වේගවත් කිරීම සහ ශ්‍රී ලංකාවට සෞභාග්‍යය ළඟා කරගැනීම උදෙසා වරාය, නාවික කටයුතු, පුනර්ජනනීය බලශක්තිය, හයිඩ්‍රොකාබන්, නිෂ්පාදනය, සෞඛ්‍ය, තොරතුරු තාක්ෂණය, සංචාරක කර්මාන්තය සහ ඖෂධ වැනි ශ්‍රී ලංකාව සඳහා ප්‍රමුඛ වන ක්ෂේත්‍රයන් හි දිගුකාලීන ආයෝජන ඉහළ නැංවීම සඳහා ඉන්දියානු රජයේ කැපවීම ද මෙම සංචාරය මගින් අවධාරණය කෙරිණ.

***

**කොළඹ**
**2023 ජනවාරි 20**